106)

# උපාධිධාරී ගුරුවරුන් වැඩිදුර අධ්‍යාපනයක් ලබා ගැනීමට දක්වන උනන්දුව, ඒ සඳහා ඔවුනට ලැබී ඇති අවස්ථා සහ ඔවුන් මුහුණ පාන ගැටළු පිළිබඳව (ගම්පහ අධ්‍යාපන දිස්ත්‍රික්කය ආශ්‍රිතව) කෙරෙන විමසීමකි.

කොළඹ විශ්ව විද්‍යාලයේ අධ්‍යාපන පීඨයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා ඉදිරිපත් කරන නිබන්ධනයයි.

අයි. කේ. ආර්. ප්‍රතිරාජ
එම්. පිල්. 87
අධ්‍යාපනවේදී උපාධි
(දෙමණපෙල ඉහල)

UCLIB
409287

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලය,
1987.10.25

409287

Class No.
Acc. No. 409287

CR

UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

24 FEB 1988

## සංක්ෂිප්තය.

විධිමත් අධ්‍යාපන පද්ධතියෙහි ගුරු අධ්‍යාපනය සකස්වීම හා වර්ධනය වීම අනුව පාසැල් අධ්‍යාපනයෙහි ගුණාත්මක භාවය තීරණය වේ. එහෙයින් ගුරුවරුන් සඳහා විවිධ අධ්‍යාපන මාධ්‍ය ඇති කිරීමේ අවශ්‍යතාව පිළිබඳව වර්තමාන ලෝක අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ පොදු පිළිගැනීමක් ඇත. උගන්වන්නවුන්ද, නොකඩවා වැඩිදුර ඉගෙන ගන්නේ නම් ඉගැන්වීම සංවර්ධනය වීමේ මාර්ග ඇතිවේ. ගුරුවරුනට ලබාදෙන පූර්ව සේවා අධ්‍යාපනය කල්-යාමේදී පැරණි වීමෙන් යල් පැනගිය තත්වයට පත්වේ. අධ්‍යාපන වෙනස්වීම් උදෙසා ගුරුවරයාගේ ආකල්පමය වූ වෙනස්වීම් අවශ්‍ය වන්නේ මේ නිසාය.

ගුරුවරයා පාසැල කේන්ද්‍ර කරගත් විධිමත් ( Formal ) අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි මෙන්ම, පාසැලින් බැහැර අවිධිමත් යාවජීව අධ්‍යාපන ක්ෂේත්‍රයේදීද, ( Non-Formal ) නියමුවෙකු විය යුතුය. ඔහු ජාතිය කාලීන පරමාර්ථ කරා යොමු කරවන හැඩගස්වන මාර්ග උපදේශකයෙකි. ඔහු බොහෝ දෑ දැනගත යුත්තෙකි. ඔහුගෙන් ජාතිය බොහෝ දෑ බලාපොරොත්තු වේ. අධ්‍යාපන අරමුණු කොයිතරම් ප්‍රබුද්ධ වුවද, ශිෂ්‍යයිනට ලැබෙන අධ්‍යාපනයෙහි වටිනාකම රඳා පවතින්නේ ගුරුවරු විෂයයෙහිය. "සියල්ලම ගුරුවරුන් මත රඳී ඇතැයි" පවසන වයිට් හෙඩ් ගේ ප්‍රකාශය අනුව අධ්‍යාපන ලෝකය තුළදී ගුරුවරයාගේ භූමිකාවේ වැදගත්කම පැහැදිලි වේ. කවර අධ්‍යාපන ක්‍රමයක් වුවද, එයට සම්බන්ධ ගුරුවරුන්ගේ තත්වය ඉක්මවා නොයයි.

UNIVERSITY OF COLOMBO LIBRARY SRI LANKA

ශ්‍රී ලංකාවේ විධිමත් අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ, විවිධ මට්ටමේ සහතික දරන්නාවූ ගුරු භවතුන් එක් ලක්ෂ පනස් දහසකට අධික පිරිසක් සේවයේ යෙදී සිටිති. මෙම පිරිස අතරින් මෙම අධ්‍යයනයෙහි අවධානය යොමු වූයේ, උපාධිධාරී ගුරු භවතුන් විෂයයෙහිය. ශ්‍රී ලංකාවේ උපාධිධාරී ගුරු භවතුන් වැඩිදුර හා අඛණ්ඩ අධ්‍යාපන කාර්යයෙහි නිරත වී නව දැනීම්, කුසලතා ආකල්ප ලබාගැනීමට දක්වන උනන්දුව, ඒ සඳහා ඔවුනට සැලසී ඇති අවස්ථා, එහිදී ඔවුන් මුහුණපාන ගැටළු, බාධක සහ ඒවා මඟහරවා ගැනීමට යෙදිය යුතු පිළියම් පිළිබඳව විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

තෝරාගත් ගුරු නියැදියකින් ඒ සඳහා විශේෂයෙන් සකස් කරන ලද ප්‍රශ්නාවලියක් මගින් ලබාගත් තොරතුරු, සම්මුඛ සාකච්ඡා සහ අදාල පොත පත පරිශීලනයෙන් ලබාගත් තොරතුරු ඇසුරෙන් මෙම අධ්‍යයනය මෙහෙයවිණි. රැස්කර ගැනුනු දත්ත විවිධ ආකාරයෙන් විශ්ලේෂණය කෙරුණි අතර ඉන් මතු වූ අදහස් හා නිගමන මත නිර්දේශ ඉදිරිපත් කෙරුණි.

මෙහි පළමුවන පරිච්ඡේදයෙන් පර්යේෂණ ක්ෂේත්‍රයෙහි වැදගත් කමත්, එයට පිවිසීමත්, අධ්‍යයනයේ අරමුණු හා පර්යේෂණ පිළිවෙත ද සැකවින් විස්තර කොට ඇත.

දෙවන පරිච්ඡේදයෙන් ගුරු අධ්‍යාපනයෙහි වැදගත්කම හා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයට සම්බන්ධ ගුරු අධ්‍යාපන වැඩපිළිවෙල පිළිබඳව අවධානය යොමුවිය. මෙහිදී ගුරු අධ්‍යාපන වැඩපිළිවෙල 1983 වර්ෂය දක්වා ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව අවධානය යොමු වූ අතර උපාධිධාරී

ගුරු භවතුන් සම්බන්ධ ගුරු අධ්‍යාපන වැඩපිළිවෙල කෙරෙහි විශේෂ අවධානය යොමු විය.

තුන්වන පරිච්ඡේදයෙන් ගුරු භවතුන් සම්බන්ධව පවතින අඛණ්ඩ හා සේවාස්ථ අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳව විමසීමක් කෙරේ.

සිව්වන පරිච්ඡේදය පර්යේෂණ සැලැස්ම හා පිළිවෙත් පැහැදිලි කිරීමට යොදා ගැනුනී. විස්තරාත්මක පර්යේෂණ ක්‍රමය මෙම අධ්‍යයනයට ගැලපෙන අතර සමීක්ෂණ ක්‍රමය යොදා ගැනිනි. ප්‍රශ්නාවලියක් උපයෝගී කොටගෙන තෝරාගත් ගුරු නියැදියකින්ද, සම්මුඛ සාකච්ඡා සහ අදාල පොත පත පරිශීලනය මගින්ද දත්ත රැස්කර ගැනුනි.

රැස්කර ගත් දත්ත පස්වන පරිච්ඡේදයෙන් විශ්ලේෂණය කොට දක්වා ඇත. පොත පත පරිශීලනයෙන් ලද තොරතුරු පුළුල් මාතෘකා දෙකක් ඔස්සේ වර්ග කෙරුණ අතර, ගුරු නියැද්යෙන් රැස් කෙරුණ දත්ත විශ්ලේෂණයේදී, වගු ගත කිරීම්, ප්‍රතිශත විශ්ලේෂණ සහ අදහස් විග්‍රහ යන ක්‍රම යොදා ගැනුනි. එම පරිච්ඡේදය අවසානයෙහි විශ්ලේෂණයෙන් මතු වූ දත්ත සාරාංශයක් ලෙස ඉදිරිපත් කෙරේ.

සයවෙනි පරිච්ඡේදය නිගමන හා නිර්දේශ සඳහා වෙන් වී ඇත. දත්ත විශ්ලේෂණය ඇසුරෙන් එලඹී නිගමනත්, ඒ අනුව ශ්‍රී ලංකාවේ උපාධිධාරී ගුරු භවතුන් සඳහා වැඩිදුර අධ්‍යාපන ක්‍රියාවලිය කෙලෙස ප්‍රතිසංවිධානය වියයුතුද යන්න පිළිබඳ නිර්දේශත් එම පරිච්ඡේදයෙහි සැකවින් දක්වා ඇත.

මෙම අධ්‍යයනයේ මූලික අනාවරණයන් සැකවින් මෙලෙස දැක්විය හැකිය.

අඛණ්ඩ ගුරු අධ්‍යාපනයක අවශ්‍යතාවය ප්‍රතිපත්තිමය වශයෙන් පිළිගත යුතු බව,

පුළුල් අරමුණු ඉටුකර ගැනීම සඳහා සැළසුම් කරන ගුරු අධ්‍යාපන ක්‍රමයක් පුළුල් ව්‍යුහයක් මත ගොඩ නැංවීමත්, යොදාගන්නා ප්‍රවේශ හා ක්‍රම අතින් විවිධත්වයක් තිබීමත් අත්‍යවශ්‍ය බව,

ශ්‍රී ලංකාවේ උපාධිධාරී ගුරු භවතුන් සම්බන්ධ ගුරු අධ්‍යාපන ක්‍රමය, කාලීන අවශ්‍යතා වලට ගැලපෙන අන්දමට හා වැඩි පිරිසකට සහභාගී විය හැකි අන්දමට ප්‍රතිසංවිධානයට ලක්විය යුතු බව,

ගුරු භවතුන් සම්බන්ධව පවතින පූර්ව සේවා අධ්‍යාපන අවස්ථා වඩාත් හොඳින් ක්‍රමවත්ව සංවිධානය කළයුතු බව හා පූර්ව සේවා අධ්‍යාපනයක අවශ්‍යතාවය පිළිගත යුතු බව,

ගුරු අවශ්‍යතා සහ ප්‍රමුඛත්වය සැලකිල්ලට ගතයුතු අතර ගුරුවරුන්ගේ ශාස්ත්‍රීය හා වෘත්තීය අධ්‍යාපන මට්ටම උසස් කරලීමට හා වර්ධනය කරලීමට හේතු වන විවිධාකාර වූ දිගුකාලීන, කෙටිකාලීන, පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා ඉදිරිපත් විය යුතු බව,

අඛණ්ඩ ගුරු අධ්‍යාපන වැඩපිළිවෙලක් සඳහා සම්පත් යොදා ගැනීමේදී රටේ ආර්ථිකයට ඔරොත්තු දෙන සම්පත් උපර්ම ප්‍රයෝජන අත්වන අන්දමට යොදා ගැනීම වැදගත් බව,

අධ්‍යාපනයෙහි ශාස්ත්‍රීය හා වෘත්තීය අංශය පමණක් නොව සාමාන්‍ය දැනීම සහ අවබෝධය වර්ධනය කරගත හැකි අවස්ථා සහ ක්‍රම ළඟා කරගැනීමේ අවස්ථා වැඩිකළයුතු බව,

ගුරු සම්පත් මධ්‍යස්ථාන වැනි අංග වලින් සමන්විත ගුරු සහායක සේවා සැපයීම අත්‍යාවශ්‍ය බව, ගුරු අධ්‍යාපන ක්‍රමයක සාර්ථකත්වය සඳහා ගුරුවරුනට අඛණ්ඩ අධ්‍යාපනයට ඇති බාධක ඉවත් කිරීමෙන් පසුබිම සැකසීම, දිරි ගැන්වීම් ලබාදීම, අඛණ්ඩ අධ්‍යාපනය ප්‍රතිඵලදායකය යන ආකල්ප ගුරුවරුන් තුළ ඇතිවන අන්දමට වැඩ සටහන් සංවිධානය කිරීම, පසුහාර හා ඇගයීම් කටයුතු සංවිධානය ආදිය අත්‍යාවශ්‍ය වන බව යනාදියයි.

වර්තමාන අධ්‍යාපනයෙන් මතු වූ කරුණු ඇසුරින් මෙම ක්ෂේත්‍රයෙහි පසු අධ්‍යයන හා පර්යේෂණ සඳහා ප්‍රවේශයන්ද මතු කෙරේ.